මමත් ඇතුළත් කරගන්න

බහුවිධ දුබලතා සහිත හෝ
අඳබිහිරි භාවය සහිත
දරුවකුගේ හඬ

CREATED IN PARTNERSHIP BY:

JUNE 2020

Perkins SCHOOL FOR THE BLIND

BLIND PEOPLE'S ASSOCIATION (INDIA) AHMEDABAD

ICEVI

cbm

Deafblind International DbI

Tanne
Schweizerische Stiftung für Taubblinde
Sinne öffnen, Dialog ermöglichen

මම දිහා ටිකක් බලන්න !

මම මෙහේ...

මමත් ඔබ වගේම දරුවෙක්, මිනිසෙක්, ඔබ වගේමයි

මගේ දුබලතාවය දිහා බලන්න එපා, මම දිහා බලන්න

මටත් ඕන නිදහසේ ස්වාධීනව ඉන්න

මට ඉගෙන ගන්න තරමක කාලයක් අවශ්‍ය වෙයි. මට ඒකට මගේම

මාර්ගයක් තියනවා. ඒ වුනාට හැම දවසකම මමත් ටික ටික

ඉගෙන ගන්නවා.

අපි ඔක්කොම එකට වැඩ කරමු. එනිසා මාත් එක්ක ඉන්න

මා ළඟ තියන අරුම පුදුම දේ සොයා ගමු...

මේ! මමත් ළමයෙක් . අපේම පවුලේ කොටසක්, ඒ විතරක් නෙමෙයි, මේ වගේ පවුල් ලෝකේ හැම තැනම ඉන්නව. අපේ අම්ම නම් කියන්නේ මට හොඳට ඇස් පේන්නේ නෑ, ඒ වුනාට කන ටිකක් ඇහෙනව, ඒ වගේම යම් යම් ද් අල්ලගන්න අමාරු කියලයි. ඒ විතරක්ද:

සවන් වහලක් පැළඳ සිටින දරුවා මව තම උකුළ මත තබා ගෙන සිටින අතර, දරුවා හැමෝම එක්ක සිනාසෙනවා



වැඩිහිටියෙකු සමඟ නල
ළිඳෙන් වතුර ගන්න දැරිවියක්

මටත් අපේ පවුලේ වැඩවලට එක්වෙන්න
ඕනෙ. මටත් ඒවට උදව්කරන්න පුළුවන්
ක්‍රම රාශියක් තියනව. අනෙක, අනිත්
ළමයින් එක්ක එකටම ඉන්න මට හරිම
ආසයි. මම අපේ පවුලේ උත්සව වලට
වගේම ගමේ උත්සව වලටත් හරි
ආසයි. බලන්න මට නල ලිදෙන් වතුර
ගන්නත් පුළුවනි. අපේ සීයා එයාගේ
බයිසිකලේ හදල තියන පුංචි කූඩෙ ඇතුළෙ
ඉඳගෙන බයිසිකලේ යන්නත් පුළුවනි. මට
ඔයාලත් එක්ක කරන්න පුළුවන් තව
ගොඩක් දේවල් තියනව

මටත් පවුලේ වැඩට වගේම මේ සමාජයේ හැම වැඩකටම සහභාගි වෙන්න පුළුවනි !

මට සෙල්ලම් කරන්නත් පුළුවනි!

මගේ ගෙදර සහ අවට තියන දේවල් සමඟ සෙල්ලම් කරන්න මම හරිම කැමැතියි. සෙල්ලම් බඩු මට ගන්න පුළුවන් වෙන්න මම ළඟින්ම තියන්න. මම අනික් ළමයින් එක්ක සෙල්ලම් කරන කොට තමයි හොඳට විනෝද වෙන්නෙ. මගේ අයියයි, අක්කයි මම ළඟින්ම සෙල්ලම් කරනකොට මම හරිම කැමතියි. මටත් ඒ අයට එකතු වෙන්නයි ඕන.

පිරිමි ළමයෙකුත් ගැහැණු ළමයෙකුත් අත් අල්ලාගෙන ක්‍රීඩාවක යෙදෙයි

ඇස් කණ්ණාඩි පැළඳි කුඩා දරුවකු විශාල බේසමක වාඩිවී පහසුවෙන් හැසිරවිය හැකි සෙල්ලම් බඩුවක් සමඟ සෙල්ලම් කරයි; එය සොලවන විට ශබ්දය හැඬවෙන සෙල්ලම් බඩුවකි

මට අදහස් හුවමාරු කරගන්නත් පුළුවනි !



මට ඔබත් එක්ක කථා බස් කරන්න ඕන. ඒක මට වගේම ඔයාටත් වැදගත්. මාත් එක්ක සම්බන්ධ වෙන්න, සෙල්ලම් කරන්න, කථා කරන්න, ඉන් පස්සෙ මගෙ ප්‍රතිචාර බලන්න. මගෙ භාෂාව එහෙම නැත්නම් මම කථා කරන විධිය තේරුම් ගන්න උත්සාහ ගන්න. මම ඔයාල කථා කරන විධිය තේරුම් ගන්න උත්සාහ ගන්නව. එතකොට අපිට එකට විනෝද වෙන්න පුළුවනි !

මට ඉගෙන ගන්නත් පුළුවනි!

දෙමව්පියන් සහ දරුවන් ස්පර්ශයෙන් අදහස් හුවමාරු කරගන්නා හැටි. අම්මා බිම ඉඳගෙන, දරුවා ඇගේ දෙපා අතර බිම වැතිරී ඇයට මුහුණ ලා සිටී. ඔවුන් දෙදෙනා එකිනෙකාට දෑත් දිගු කරමින් අත්පුඩි ගසති

ළමයකු ආච්චිත් එක්ක පළා වට්ටියක් ළඟ වාඩිවෙලා පළා තෝරනව. දවල්ට මැල්ලුමක් හදන්න දෙන්නම එකතුවෙලා පළා කොළ වල නැටි කඩල අයින් කරනව .



ඒක පුංචි පියවරක් වෙන්න ඇති. ඒ වුනාට ඒ හැම දේකින්ම නිතරම මම යමක් ඉගෙන ගන්නව. එක එක දේවල් මගේ අත්වලට දැනෙන කොට ඒව පාවිච්චි කරන්නේ කොහොමද කියල මට තේරෙනව. තනියම මගේ දේවල් කරගන්න, මට ගොඩාක් පුහුණුව අවශ්‍ය වෙනව. ඒ වගේම බොහොම කාලයක් ඕන වෙනව. එනිසා මට දිනපතා අනුගමනය කිරීමට දින චරියාවක් හදල, මට ඉගෙනීමට උදව් කරන්න ඔබට පුළුවනි. ඔව්, එතකොට අනිත් ළමයි වගේ මට ඉස්කෝලෙ යන්නත් පුළුවනි.!

මට ආදරය කරන්න හරි ලේසියි... මමත් ඔබට හරිම ආදරෙයි

හැම දරුවෙකුටම ආදරය සහ සැලකිල්ල අවශ්‍යයයි. මටත් ඒ වගේමයි!. මමත් ඔබට ගොඩක් ආදරෙයි, ඒ වුනාට මට ඒ ආදරය ඔබට පෙන්වන්න අපහසුයි, බැරි වෙයි. ඒ වුනාට ඔබ මට ආදරය කරන බව, සැලකිලිමත් වන බව මට පෙන්වන්න නම් ඕන. එතකොට මට ඔබේ ආදරය දැනේවි



මතක තබාගන්න මම පුංචි දරුවෙක් ඒ වගේම මම වටිනාම තෑග්ගක්

තාත්තා තම පුංචි බබාව මුහුණ ළඟට ගෙන ආදරයෙන් ඉඹ ගන්නවා

අයියා සහ නංගී එකිනෙකා වැළඳගෙන සිනාසෙයි

මමත් අනික් අය වගේම ප්‍රීතිය, හැකියාවන් මෙන්ම දඟකාරකම් සහ සිහින වලින් පිරී ගිය දරුවෙක්. ඔයාට මාව පේනවද? මම මෙහේ, අපේම සමාජය ඇතුළෙ ඉන්නෙ, අපේ අසල්වැසි සමාජය ඇතුළෙ. ආදරය අවශ්‍ය, ආදරය, ගෞරවය සහ සමාජයට ඇතුළ්වීමට බලාසිටින පුංචි දරුවෙක්. ඔබ මාව අගය කොට දිරිමත් කළහොත් සමාජයේ අනෙක් අය ද එසේම කරනු ඇති!. එක්තරා කාලයක මා වැනිම දරුවෙක් සිටියා. ඇය **හෙලන් කෙලර්** නම් ප්‍රසිද්ධ කාන්තාවක් ලෙස හැදී වැඩුණා, ඇය වරක් පැවසුවේ, " අපට තනිවම කළ හැක්කේ ඉතා පොඩි දෙයක්, එහෙත් අප සැවොම එක්ව කළ හැකි දේ ඉතා විශාලයි. මට සිහින ගොඩක් තියනවා. ඒවා සැබෑ කරගන්න ඔබ මට උදව් කරනවාද? " යන්නයි.

සිංහල භාෂාවට පරිවර්තනය කළේ,
ටී.ඩී.ටී.එල්. ධනපාල
ICEVI – Sri Lanka